# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2324/23 – 2023 මාර්තු මස 22 වැනි බදාදා – 2023.03.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/05/2017/05.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2019.03.28 දිනැති හා අංක 2116/55 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2019.03.14 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් මරදගහමුල, හපුවලාන හි පදිංචි එම්. කේ. මාකස් අබේපාල මයා සහ කොළඹ 05, කිරුළ පාර අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2022.11.18 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 මාර්තු මස 02 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

1A – G 39162 – 20 (2023/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.

එම්. කේ. මාකස් අබේපාල මයා,
හපුවලාන,
මරඳගහමුල.

*පළමු පාර්ශවය*

*යොමු අංකය:* IR/COM/05/2017/05.
නඩු අංකය: A/32/2019

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
අංක 200,
කිරුළ පාර,
කොළඹ 05.

*දෙවන පාර්ශවය*

ප්‍රදානය

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර මැතිතුමා විසින් වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 4 සහ 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියැවෙන) පනත් වලින් සංශෝධනය වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වගන්තිය යටතේ කම්කරු හා වෘත්තිය සමිති සබඳතා අමාත්‍යතුමාට පැවරී ඇති බලතල ප්‍රකාර ව උක්ත ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා 2019.03.14 දිනැති නියෝගයෙන් බේරුම්කරුවෙකු වශයෙන් මා පත්කොට මා වෙත යොමුකර ඇත.

***ආරාවුලට හේතු වී ඇති කාරණය:***

බේරුම්කරණය සඳහා මා වෙත යොමු කොට ඇති උක්ත නියෝගය ප්‍රකාර ව ඉහත සඳහන් දෙපාර්ශවය අතර උද්ගත වී ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ:

''2008.07.13 දින සිදුවී ඇති සිද්ධියකට අදාළව 2013.10.01 වන දින සිට වැටුප් රහිතව සේවය අත්හිටුවා, 2013.10.16, දිනැතිව චෝදනා පත්‍රයක් ලබා දී පවත්වා ඇති විනය පරීක්ෂණයෙන් පසුව දින 5ක වැටුප් දඩයක් සහ අවවාද කිරීමක් ලෙස ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් ලබා දී ඇති දඬුවම මඟින් සහ 2013.10.01 දින සිට 2014.03.01 දින දක්වා වැටුප් රහිතව සේවය අත්හිටුවා තැබීමෙන්, එම්. කේ. මාකස් අබේපාල මහතාට අසාධාරණයක් සිදු වී තිබේද? යන්න හා එසේ අසාධාරණයක් සිදුව ඇත්නම් හිමිවිය යුතු සහන මොනවාද යන්න පිළිබඳව වේ''.

***බේරුම්කරණ විභාග පටිපාටිය:***

2019.10.30, 2019.12.05, 2020.01.30, 2020.03.03, 2020.07.01, 2020.09.08 සහ 2021.02.17 දිනයන්හි දී මා විසින් මෙම බේරුම්කරණ විභාගය පවත්වා අවසන් කර ඇත. පරීක්ෂණය සඳහා දින නියම කරනු ලැබූ දිනයන් කීපයක දී විවිධ හේතුන් නිසා බේරුම්කරණ විභාගය පැවැත්වීමට නොහැකි වූ බව ද සටහන් කරමි.

සහනය පතන එම්.කේ.මාකස් අබේපාල යන අය බේරුම්කරණ විභාගය පැවැත්වුණු සෑම දිනක ම සහභාගී වූ අතර, ඔහු වෙනුවෙන් බලය පවරන ලද නියෝජිත එම්.ඒ.දයාරත්න මහතා දෙවැනි පරීක්ෂණ දිනයේ සිට බේරුම්කරණ විභාගය පැවති සෑම දිනක ම පෙනී සිටියේ ය. දෙවැනි පාර්ශ්වයේ ආයතනයේ ලිපිකරු නිලධාරියෙකු වන ප්‍රසන්න සේනාරත්න මහතා මුල් දිනයේ දීත්, නීති නිලධාරිනී නදීෂා අමරතුංග මහත්මිය 2020.07.01 හැර පරීක්ෂණය පැවැත්වූ දෙවැනි දිනයේ සිට සියලු දිනයන්හි දීත් ආයතනය වෙනුවෙන් සහභාගී වූ අතර, 2019.12.05 දින සිට සෑම පරීක්ෂණ දිනයක ම රජයේ නීතිඥ එෆ්.ෆායිස් මහතා ආයතනය වෙනුවෙන් පෙනී සිටියේ ය.

මෙම බේරුම්කරණ විභාගයේ දී හබයකින් තොර ව පළමුවැනි පාර්ශවය සාක්ෂි විභාගය පළමුවෙන් ආරම්භ කළ අතර එම පාර්ශවය වෙනුවෙන් සහනය පතන එම්.කේ.මාකස් අබේපාල යන අයගේ වාචික ව ඉදිරිපත් වූ සාක්ෂිය පමණක් මෙහෙයවන ලදී. දෙවැනි පාර්ශවය වෙනුවෙන් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ දිවුලපිටිය ඩිපෝ කළමනාකරු එල්.ඩබ්ලිව්.ඉන්දික සුරංග, නිලධාරී (දැනට විශ්‍රාමික) කලුආරච්චි කංකානමලාගේ සුජීව කලුආරච්චි යන අයවලුන්ගේ වාචික සාක්ෂි මෙහෙයවන ලදී. කලුආරච්චි කංකානමලාගේ සුජීව කලුආරච්චි යන අයගේ මූලික සාක්ෂිය ඉදිරිපත් කෙරුනේ දෙපාර්ශවයේ එකඟතාව මත දිවුරුම් පෙත්සමක් මාර්ගයෙනි.

මෙම පරීක්ෂණයේ දී පළමුවැනි පාර්ශවය විසින් A1 සිට A10 දක්වා ද, දෙවැනි පාර්ශ්වය විසින් R1 සිට R8 දක්වා ද ලේඛන, අතුරු ලේඛන ද සමඟ ලකුණු කොට ඉදිරිපත් කරන ලදී. ඊට අමතරව පළමුවැනි පාර්ශවය විසින් තම අවසන් ලිඛිත සැළකිරීම් වලට සහාය පිණිස X, XI, XII ලෙස ලකුණු කළ ලේඛන තුනක් අමුණා තිබුණි.

***පසුබිම:***

සහනය පතන එම්.කේ.මාකස් අබේපාල නමැති අය ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ දිවුලපිටිය ඩිපෝවේ 1994.02.01 සිට අනියම් බස් රියදුරෙකු වශයෙන් ද 1996.04.01 දින සිට ස්ථිර බස් රියදුරෙකු වශයෙන් ද පත් කරනු ලැබ මේ දක්වා මණ්ඩලයේ සේවයේ යෙදී සිටි (A1 ලේඛනය අනුව). 2008.07.13 දින රියදුරු රාජකාරියේ යෙදෙමින් සිටිය දී මගියෙකුගෙන් වංචනික ලෙස ගමන් ගාස්තුවක් ලබා ගත්තේය යන චෝදනාව ගොනු කිරීමෙන් පසු ඔහුට එරෙහි විනය ක්‍රියාමාර්ගයක් අරඹනු ලැබ ඇත. 2008.07.13 දින ඔහුට පැවරී තිබුණු රාජකාරිය වූයේ උදේ 7.30 නුවර බලා පිටත් වන අංක 62/8879 දරන බස් රථය දිවුලපිටියෙන් උදේ 6ට පිටත් ව ඇවරිවත්තට ගෙන ඒමයි. බස් රථය උදේ 6.45 වන විට ඇවරිවත්ත බස් නැවතුම්පලට පැමිණ ඇත. එම බස් රථයේ මගීන් 40 දෙනෙකු පමණ සිට ඇති අතර රත්නපාල නමැති කොන්දොස්තරවරයෙකු ද රාජකාරියේ නිරත වී සිට ඇත. බස් රථය නැවතුම්පළේ නවතා ඒ තුළ රැඳී සිටිය දී, ඔහු බස් රථයේ ගමන් ගත් මගී කාන්තාවකගෙන් රුපියල් දහයක මුදලක් ලබා ගෙන ඉතිරි රුපියල් දෙකක් අතට දී රුපියල් අටක බස් ගාස්තුවක් නීතිවිරෝධී ලෙස ගැනීමෙන් එකී අබේපාල යන අය මූල්‍යමය වංචාවක් සිදු කරන ලද්දේ ය, යන්න චෝදනාවට අදාල විය. ඒ අනුව ඔහුට චෝදනා පත්‍රයක් නිකුත් කරනු ලැබ පසුව පවත්වන ලද විනය පරීක්ෂණයකින් පසු ව චෝදනා වලට වැරදිකරු වීම නිසා පහත දඬුවම් (A4 මඟින්) නියම කරනු ලැබ ඇත.

1. මාස එකකට සේවය අත්හිටුවීම.
2. මින් ඉදිරියට මෙවැනි විෂමාචාර සිදුකර වැරදිකරු වුවහොත් දැඩි දඬුවම් පමුණුවන බවට තරයේ අවවාද කිරීම.

නියම කරන ලද දඬුවමක් ලෙස ලැයිස්තුගත කර නැතත් වැඩ තහනමකට ලක් ව සිටි 2013.10.01 සිට 2014.03.01 දක්වා වූ මාස පහක කාලයකට වේතන අහිමි කිරීම තවත් එකතු කරන ලද දඬුවමක් ලෙස පෙන්විය හැකි ය. පසු ව ඔහු විසින් ඉදිරිපත් කරන ලද අභියාචනයක් සලකා බැලූ ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ ගම්පහ ප්‍රාදේශිකයේ අභියාචනා මණ්ඩලය විසින් පළමුවැනි දඬුවම ලෙස නියම කර තිබූ මසක කාලයක් සේවය අත්හිටුවීම ඉවත් කොට ඊට දින පහක දඩයක් ආදේශ කොට ඇත. කෙසේ වුව ද එම දඩ මුදල මේ වනතුරු අයකරගෙන නොමැති බව ද පරීක්ෂණයේ දී සඳහන් විය.

පළමුවැනි පාර්ශවයේ සහනය පතන අබේපාල මහතා ඉල්ලා සිටින්නේ තමාට එරෙහි ව පනවා ඇති ඉහත කී දඬුවම් ඉවත් කර දෙන ලෙසයි. මගියෙකුගෙන් බස් ගමන් ගාස්තුවක් ලෙස මුදල් ලබා ගත්තේ යන තමාට විරුද්ධ ව නගා තිබුණු චෝදනාව අභූත චෝදනාවක් ලෙස බේරුම්කරණ විභාගය ආරම්භයේ දී සිට ම අබේපාල යන අය විසින් ප්‍රතික්ෂේප කරනු ලැබ ඇත. මෙම බේරුම්කරණ විභාගයේ දී වෙනත් කිසිදු පුද්ගලයෙකු සාක්ෂියට නොකැඳවා තමාගේ සාක්ෂිය පමණක් ඔහුගේ පැමිණිල්ල සනාථ කිරීමට ඉදිරිපත් කර ඇත.

දෙවැනි පාර්ශවයේ ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ ස්ථාවරය වන්නේ A3 සහ R4 වශයෙන් ලකුණු කරන ලද ලේඛනයේ සඳහන් පහත සඳහන් චෝදනාවන් අබේපාල නමැති අයට එල්ල කරන ලද බවයි.

චෝදනාව :-

ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ දිවුලපිටිය ඩිපෝවේ වෘත්තිය බස් කොන්දොස්තරවරයෙකු වූ ඔබ, 2008.07.13 දින 62-8179 දරන බස් රථයේ සේවය කරමින් සිටිය දී,

01. කෝවින්න සිට ඇවරියවත්ත දක්වා ගමන් ගන්නා කාන්තා මගියකුගෙන් බසින අවස්ථාවේ තම රියදුරු අසුනේ සිට රු. 10.00 මුදල ලබාගෙන ඉතිරි මුදල් වශයෙන් රු. 02.00 ආපසු දී ඇත්තේ ය.

02.මගී ප්‍රකාශය අත්සන් කිරීම ප්‍රතික්ෂේප කර ඇත්තෙහිය.

03. ප්‍රකාශයක් ලබා දීම හා නිලධාරි වාර්තාව අත්සන් කිරීම ප්‍රතික්ෂේප කර ඇත්තෙහිය.

04. ඉහත සඳහන් චෝදනා එකක් හෝ සියල්ලම සිදු කිරීමෙන් ද, මණ්ඩලය ඔබ කෙරෙහි තබා තිබූ විශ්වාසය කඩ කිරීමෙන් ද, පනවා ඇති නීති රීති වලට හා දී ඇති උපදෙස් වලට පටහැනිව ක්‍රියා කිරීමෙන් ද, එය අකාර්යක්ෂම වූවෙහිය.''

එකී චෝදනා සම්බන්ධයෙන් පවත්වන ලද පරීක්ෂණයේ නිගමනයන් අනුව ඔහුට විරුද්ධ ව පහත දැක්වෙන විනය නියෝග පනවන ලද බවයි.

''සේවය තහනම් කල කාලයට නොගෙවූ වේතන අහිමි කරමින් මෙහි පහතින් දැක්වෙන දඬුවම් පමුණුවමි.

01. මාස (01) එකකට සේවය තාවකාලිකව අත්හිටුවීම.
02. මින් ඉදිරියට මෙවැනි විෂමාචාර සිදුකර වරදකරු උවහොත් දැඩි දඬුවම් පමුණුවන බවට තරයේ අවවාද කිරීම.''

බේරුම්කරණ විභාගයේ දී දෙවැනිපාර්ශවයේ ස්ථාවරය සනාථ කිරීම සඳහා පහත සඳහන් සාක්ෂිකරුවන්ගේ සාක්ෂි විභාග කෙරුණි. එකී සාක්ෂි මගින් දෙවැනි පාර්ශවය තහවුරු කිරීමට උත්සාහ කළේ ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ අනුමත ව භාවිත වන විනය ව්‍යවස්ථාව ප්‍රකාර ව කටයුතු කිරීමෙන් පසු ව මෙහි සහනය පතන අබේපාල නැමැත්තා මූල්‍ය වංචාවක් සිදු කර ඇති බවට තහවුරු කර ගැනීමෙන් අනතුරු ව, විනය බලධාරියා විසින් පනවන ලද විනය නියෝගය ක්‍රියාත්මක කර ඇති බවයි.

මෙම බේරුම්කරණ විභාගයේ දී පිළිතුරු සපයා ගත යුතු ගැටලුව වන්නේ අබේපාල යන අය මූල්‍ය විෂමතාවක් සිදු කර ඇති බවට නිගමනය කර ගැනීමට පදනම් කර ගත් විනය ක්‍රියාමාර්ගය පිළිබඳ ව සෑහීමකට පත් විය හැකි ද යන්නයි. එය සාධාරණ ව සහ යුක්ති සහගත ව සිදු කර ඇත්ද? චෝදනා වල ඇතුළත් කරුණු විනය ක්‍රියාමාර්ගයේ දී නිශ්චිත ව සනාථ වී ඇත්ද? ඒ සම්බන්ධයෙන් දඬුවම් පැමිණවීමේ දී පදනම් කර ගත් කරුණු සාධාරණ ද? යන ඒවා වේ.

මෙම චෝදනාවන්ට පදනම් වූ සිද්ධියට අදාල සිද්ධිමය කරුණු පිළිබඳ පසුබිම මෙහි ලා විශේෂයෙන් සැළකිල්ලට ගත යුතු වේ. උදෑසන රාජකාරියට වාර්තා කොට, ඩිපෝවෙන් බස් රථය භාර ගෙන, දිවුලපිටියට පැමිණ, එතැනින් මගීන් නංවා ගෙන, උදේ 6ට බස් රථය පිටත් ව, ඇවරිවත්තට පැමිණ ඇත. බස් රථයේ මගීන් 40ක් පමණ සිටි බව සාක්ෂි විභාගයේ දී සඳහන් විය. තවද එහි කොන්දොස්තරවරයෙකු ද සේවය කරමින් සිට ඇත. බේරුම්කරණ විභාගයේ දී දිවුරුම් පෙත්සමක මාර්ගයෙන් සාක්ෂියක් ලබා දී හරස් ප්‍රශ්න වලට මුහුණ දුන්, මේ වන විට සේවයෙන් විශ්‍රාම ගොස් ඇති කළුආරච්චි කංකානම්ලාගේ සුජීව කළුආරච්චි නමැත්තා මෙම සිද්ධිය සිදු වූයේ යැයි කියන අවස්ථාවේ ඊට සෘජු ව සම්බන්ධ වූ නිලධාරියෙකි. ඔහු ඒ අවස්ථාවේ සේවය කර ඇත්තේ ජංගම පරීක්ෂණ භාරව කටයුතු කරන නිළධාරියෙකු ලෙසයි. වාචික ව බේරුම්කරණය ඉදිරියේ විවෘත ව දෙන සාක්ෂියක වටිනාකමට සමාන වටිනාකමක් ඇති වන සේ මූලික සාක්ෂිය ලෙස ඉදිරිපත් කරන දිවුරුම් පෙත්සම ස්වකීය ස්වාධීන සාක්ෂියක ස්වරූපය පෙන්නුම් කරන්නක් විය යුතු ය. පාලන අධිකාරිය විසින් සකස් කරනු ලදු ව සාක්ෂිකරුගේ අත්සන තබා ගත් දිවුරුම් පෙත්සමක් ලෙස පෙනී යන මෙහි, සාක්ෂිකරුගේ නිරවද්‍ය සහ ස්වාධීන සාක්ෂියක් ඇතුළත් වී ඇත්ද යන්න සැකයට තුඩු දෙයි. ඌරාපොල පදිංචි කරුවෙකු වන ඔහු දිවුරුම් පෙත්සම අත්සන් කරන්නේ නාරාහේන්පිට ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය තුළ දී, ගංගොඩවිල නුගේගොඩ පදිංචි සාමදාන විනිශ්වයකරුවෙකු ඉදිරිපිට දී බවට ඉන් කියවේ. තවද මූලික සාක්ෂිය ලෙස දිවුරුම් පෙත්සම ඉදිරිපත් කරමින් සාක්ෂිකරු වාචික ව කියා සිටියේ (2021.12.01 දින කාර්ය සටහන් පිටු අංක 04) තමා දිවුරුම් පෙත්සම ඉදිරිපත් කලේ 2021.02.10 දින දී කියා ය. දිවුරුම් පෙත්සමේ ශීර්ෂයේ එසේ 2021.02.10 දින ලෙස සඳහන් කර ඇතත්, එම ලේඛනයේ ම සාමදාන විනිශ්වයකාරතැන ඉදිරියේ ප්‍රතිඥා දී අත්සන් කොට ඇත්තේ 2021.02.05 වන දින දී බව සඳහන් ය. එක ම ලේඛනයේ දින දෙකක් එක ම කාරණයක් සඳහා සඳහන් කර තිබීමෙන් මෙම දිවුරුම් පෙත්සමේ අවිධිමත් භාවයට නිදසුනක් සැපයේ. තවද අබේපාල නමැත්තා විසින් මෙහි සඳහන් වන විෂමාචාරය සිදු කිරීමේ දී සාක්ෂිකරු ඊට අදාල රාජකාරි ඉටු කළ දිනය ලෙස දිවුරුම් පෙත්සමේ 6, 7, 12(i), 15, 17 සහ 19 යන ඡේදවල 2008.07.13 ලෙස දක්වන අතර, 13 සහ 14(i) ඡේදවල එය 2008.07.08 ලෙස දක්වා ඇත. මෙම විෂමතා අත්වැරදීම් වලට වඩා ලේඛනයේ ස්වකීයත්වය නොමැති වීම හේතුවෙන් සිදු වූ දෝෂයන් බව නිගමනය කළ හැකි ය. හරස් ප්‍රශ්න වල දී සාක්ෂිකරු ලබා දුන් ඇතැම් පිළිතුරු වලින් ද එම තත්ත්වය මනා ව පැහැදිලි විය.

මෙහි ලා නිරීක්ෂණය කරන ලද තවත් වැදගත් කරුණක් වන්නේ අබේපාල නමැත්තාට එරෙහි ව නිකුත් කර ඇති චෝදනා පත්‍රයේ දෝෂ සහගත බව සහ බේරුම්කරණ විභාගයේ දී එකී චෝදනා පිළිබඳ ව ඉදිරිපත් කෙරුණු කරුණුවල නොගැලපීම් සහ නොසෑසඳීමේ ය. ඉහත කී චෝදනා පත්‍රයේ මෙසේ ද සටහන් කර තිබුණි.

''ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ දිවුලපිටිය ඩිපෝවේ වෘත්තීය බස් කොන්දොස්තරවරයෙකු වූ ඔබ....''

තවද චෝදනා පත්‍රයේ පළමුවෙනි ඡේදයේ චූදිතට නගා තිබුණු චෝදනා ''බරපතල විෂමාචාර ක්‍රියාවලින් එකක්'' බව සඳහන් වේ. මූල්‍ය වංචාවකට සම්බන්ධ වරදක් බැවින් අදාල වන මුදල් ප්‍රමාණය කුඩා වුවත් නිසැකව ම එය 'බරපතල වැරදි' ගණයට වැටෙන එකකි. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ගම්පහ ප්‍රාදේශික කාර්යාලයේ විනය විභාග නිළධාරි ඒ.ආර්.අරණායක මහතා 2021.09.08 දින (කා.ස. 07 පිටුව) සාක්ෂි දෙමින්,

''ප්‍ර: දැන් සාක්ෂිකරු යම්කිසි සේවකයෙකුගේ සේවය තහනම් කළ කාලයට ඔහුගේ විනය විභාගය අවසන් වූ පසුව එම කාලයට අහිමි වූ හිඟ වේතන මණ්ඩලයෙන් ලබාගත හැකි ද?

පි: එහෙම ගෙවීමක් කරන්නේ නැහැ.

ප්‍ර: තමා එසේ පවසන්නේ කිනම් පදනමකින් ද?

පි: බරපතල විශමාචාරයක් නිසා.''

එය සේවයෙන් පහ කිරීමට හෝ වෙනත් ආකාරයක බරපතල දඬුවමකට යටත් වන වරදකි. එසේ වුවත් ඔහුට එරෙහි ව පවත්වන ලදයි සඳහන් වන විනය පරීක්ෂණය බරපතල චෝදනා සම්බන්ධයෙන් පවත්වන ලද විනය පරීක්ෂණයක ස්වභාවයක වූ බවට බේරුම්කරණ විභාගයේ දී කරුණු හෙළි වුණේ නැත. මෙම බේරුම්කරණ විභාගයේ දී පළමුවැනි පාර්ශවයට සාක්ෂි ලියවිල්ලක් ලෙස ලකුණු කළ ලේඛනයක ආකාරයෙන් යොදා ගත හැකි ව තිබුණු ඉතා ප්‍රයෝජනවත් සාක්ෂියක් වන්නේ අදාල චෝදනා පත්‍රය සම්බන්ධයෙන් ඔහුට එරෙහි ව පැවති ගෘහස්ථ විනය පරීක්ෂණයේ පරීක්ෂණ වාර්තාවයි. එබඳු පරීක්ෂණ වාර්තාවක් මෙම බේරුම්කරණ විභාගයේ දී ඉදිරිපත් නොවූවා පමණක් නොව, ඒ පිළිබඳ කිසිඳු සඳහනක්වත් සිදු වුණේ නැත. මෙහි දී බේරුම්කරණයේ අවධානය පළමුවැනි පාර්ශවයේ අවසන් ලිඛිත සැළ කිරීම් සමඟ X1 ලේඛනය ලෙස අමුණා ඉදිරිපත් කළ ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ විනය ව්‍යවස්ථා මාලාවේ 05 ඡේදයෙන් විස්තර වන්නේ බරපතල නොවන විෂමාචාර ක්‍රියාවන් පිළිබඳ ව ශ්‍රී ලංගමය අනුගමනය කරන පිළිවෙතයි. එහි 5.2 ඡේදයේ දක්වා ඇත්තේ ''මෙම ව්‍යවස්ථාව යටතේ පවත්වන ලඝු විභාගයක සාක්ෂි වාර්තා ගත කිරීම අවශ්‍ය නොවේ'' යනුවෙනි. මේ සියල්ල සැලකූ කල ගම්‍ය වන කාරණය නම් එක්කෝ එකී පරීක්ෂණයෙන් කරන ලද සාක්ෂි විභාගයක සටහන් තබාගෙන නැති බවයි. එසේ නැතිනම් කෙතරම් වැදගත් ලේඛනයක් වුවත් එකී පරීක්ෂණ වාර්තාව ඉදිරිපත් කිරීමෙන් තම පාර්ශවයට අවාසියක් විය හැකි නිසා දෙවැනි පාර්ශවය විසින් එය ඉදිරිපත් කිරීමෙන් හිතාමතා වැළකී සිටි බවයි.

තවද අබේපාල නමැත්තාට මුදල දුන්නේ යැයි කියන කාන්තාවගෙන් ලබාගත් ''මගී වාර්තාවක්'' ගැන බේරුම්කරණ විභාගයේදී සඳහන් වුව ද එය කිසි විටෙකත් පරීක්ෂණයට ඉදිරිපත් වූයේ නැති අතර, එය දෙවැනි පාර්ශවයට වාසිදායක ලෙස පාවිච්චි කළ හැකි ව තිබුනු ඉතා ප්‍රයෝජනවත් ලියවිල්ලක් බවට සැකයක් නැත. සාක්ෂි වටිනාකමකින් යුතු ව පිළිගැනීමට නම් අදාල මුදල් ගෙවන ලද්දේ යැයි කියන මල්ලිකා මායාදුන්නේ නැමැති මගී කාන්තාව බේරුම්කරණ විභාගයේ දී සාක්ෂියක් දී තමා ඒ අවස්ථාවේ ලබා දුන්නේ යැයි කියන ප්‍රකාශයේ සඳහන් කරුණු තහවුරු කළ යුතු ව තිබිණ. මගී ප්‍රකාශයට අත්සන් තැබීම ප්‍රතික්ෂේප කිරීම පළමුවැනි පාර්ශවයේ ඉල්ලුම්කරුට එරෙහි ව නගා තිබුණු වැදගත් චෝදනාවකි. එහෙත් එම වරද පරිපූර්ණ වූ බවට ප්‍රමාණවත් සාක්ෂි පරීක්ෂණයේ දී ඉදිරිපත් වුනේ නැත. සුජීව කළුආරච්චි නැමැති දෙවැනි පාර්ශවය විසින් සාක්ෂි මෙහෙයවන ලද සාක්ෂිකරුගේ මූලික සාක්ෂිය ලෙස ඉදිරිපත් කෙරුණු දිවුරුම් පෙත්සමේ 14 වන ඡේදයේ iii හි මෙසේ සඳහන් කර ඇත.

''එසේ පැමිණිල්ල ලියා අවසන් කල පසු මෙසේ පැමිණිලි කල සේවකයාගේ අත්සන පැමිණිලි කරන නිලධාරිය විසින් ලබාගත යුතු වේ. මෙවැනි සේවකයෙකු අත්සන තැබීම ප්‍රතික්ෂේප කරන අවස්ථාවලදී මෙසේ ප්‍රතික්ෂේප කළ බවට, එම පැමිණිල්ලේ සටහනක් යොදා එතැන සිටි සෑම ජංගම පරීක්ෂකයෙකුවම අත්සන් කළ යුතු බවත් ය.''

මෙහි දී පැමිණිල්ල යන්න සහ පැමිණිලි කළ සේවකයාගේ අත්සන යන්න පිළිබඳ කරුණ පැහැදිලි නැත. එය කාගේ පැමිණිල්ලක් ද, මගියා කළ පැමිණිල්කට චූදිතයා අත්සන් කිරීමේ අවශ්‍යතාව කුමක් ද යන්න ද වටහා ගත නොහැක. මෙහි දී පැමිණිලි කළ සේවකයා කවුරුන් ද යන්න ගැටලුවකි. අබේපාල නමැති අය යම් කාන්තාවකගෙන් බස් ගාස්තුවක් ලෙස මුදලක් ගත්තා නම් ඉතිරි මුදල් ද ආපසු ඇයට දුන්නා නම්, ඒ අය දෙනු ලබන පැමිණිල්ලකට හෝ ප්‍රකාශයකට චූදිත අත්සන් කිරීමක් අදාල නොවේ. සැබැවින්

අවශ්‍ය වන්නේ සිද්ධිය පිළිබඳ ව අබේපාල නමැති අයගේ ප්‍රකාශයක් සටහන් කර ගැනීමයි. එහි දී ඔහු කරන ප්‍රකාශය සටහන් කර ගෙන ඊට අත්සන් ලබා ගැනීම පිළිගත් පටිපාටියයි. කෙසේ වුවත් (මගී ප්‍රකාශයකට අත්සන් ලබා ගැනීමේ අවශ්‍යතාවක් තිබිය දී එය අත්සන් කිරීම ප්‍රතික්ෂේප කළේ නම් මෙහි දී අනුමාන කළ හැක්කේ සඳහන් කර ඇති පරිදි එතැන කාර්ය භාර ව සිටි නිළධාරින්ගේ අත්සන් යොදා ඉදිරිපත් කළයුතු විය. එවැන්නක් කළ බවට එම දිවුරුම් පෙත්සමේ 15 වන ඡේදයේ සඳහන් වුව ද එබඳු ලේඛනයක් බේරුම්කරණ විභාගයේ දී කිසි විටෙක ඉදිරිපත් නොවුණි. එය සනාථ කිරීමට ආර්4 ලේඛනය උපයෝගී කරගත යුතු බව එහි කියැවේ. ආර් 4 ලෙස ලකුණු කර ඉදිරිපත් කළ ලේඛනය එබඳු සටහන් කළ ප්‍රකාශයක් හෝ වාර්තාවක් නොව අබේපාල නමැත්තාට එරෙහි ව නිකුත් කරන ලද චෝදනාපත්‍රයයි.

එකී දිවුරුම් පෙත්සමේ 11 වන ඡේදයට අනුව මෙම සිද්ධිය වුනා යැයි කියන අවස්ථාවේ චූදිත රියදුරු අසල සිටි බවත් බසය තුළ කොන්දොස්තරවරයෙකු සිටි බවක් කියැවේ. බසයක රියදුරෙකු මගියෙකුගෙන් මුදලක් ගත්තේ කෙසේ දැයි ද මගියෙකු කොන්දොස්තර වරයෙකු සිටිය දී රියදුරුට මුදල් දී, පිට ව ගොස් එය වරදක් සේ සලකා පැමිණිලි කරන්නේ කෙසේ ද යන්න තවත් ගැටලුවකි. එකී කොන්දොස්තරවරයාගේ සාක්ෂියක් මෙහෙයවූයේ නම් මෙම සිද්ධිය පිළිබඳව යථා තත්ත්වය තවදුරටත් පැහැදිලි ව අනාවරණය කරගත හැකිව තිබුණි. 2020.03.03 වන දින බේරුම්කරණය විභාගය පැවැත්වුන දිනයේ දී එකී එස්.ඒ.රත්නසිරි නැමැති කොන්දොස්තරවරයා දෙවැනි පාර්ශ්වය වෙනුවෙන් පැමිණ සිටි බවට පැමිණීම සටහන් කරන ලද නමුත් එදින දී හෝ ඉන් පසු අවස්ථාවක හෝ ඔහුගේ සාක්ෂිය මෙහෙයවනු නොලැබූයේ ඇයි ද යන්න ද ගැටලුවකි.

මෙම කරුණු සැලකිල්ලට ගත් කළ මෙහි සහනය පතන එම්.කේ.මාකස් අබේපාල මහතාට එරෙහි ව අනුගමනය කර ඇති විනය පටිපාටියේ ද, දඬුවම් පැමිණවීමේ දී ද යුක්තිය ඉෂ්ඨ වී නැති බව මගේ නිරීක්ෂණය සහ නිගමනය වේ.

ආරම්භයේ දී දෙපාර්ශවය ලබා දුන් ප්‍රකාශයන් ද, මෙම බේරුම්කරණ විභාගයේ දී මෙහෙයවන ලද සාක්ෂි ද, දෙපාර්ශවය වෙනුවෙන් පෙනී සිටි නීතිඥ මහතා සහ බලය පවරන ලද නියෝජිත මහතා ඉදිරිපත් කළ අවසන් ලිඛිත සැලකිරීම් ද සැළකිල්ලට ගෙන යොමුවේ සඳහන් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස් රියැදුරෙකු ලෙස සේවය කරන එම්.කේ.මාකස් අබේපාල යන අයට නියම කර ඇති දඬුවම් පැනවීමේ දී අසාධාරණයක් සිදු වී ඇති බවටත්, ඒ අනුව ඔහුට මේ වනවිටත් පනවා ඇති දඬුවම්වලින් ඔහු නිදහස් කිරීමත් සුදුසු බවට මම තීරණය කරමි. ඒ අනුව පළමුවැනි පාර්ශ්වයේ සහනය පතන ඉල්ලුම්කරුට ලබා දිය යුතු සහනයන් ඇතුලත් පහත සඳහන් ප්‍රදානය පිළිගන්වමි.

## ප්‍රදානය

1. පළමුවැනි පාර්ශවයේ ඉල්ලුම්කරු එම්.කේ.මාකස් අබේපාල යන අයට එරෙහි ව මේ වන විට පනවා ඇති දින පහක වේතන දඩයක් පැනවීමට කර ඇති තීරණය අහෝසි කළ යුතු වේ. (මේ වන විටත් එම දඩ මුදල අය කර ගෙන නොමැති බව අනාවරණය විය.)

2. දඬුවමක් ලෙස පනවා ඇති තරයේ අවවාද කිරීම ඉවත් කොට ඒ බව ඔහුගේ පෞද්ගලික ලිපිගොනුවේ සටහන් කළ යුතු ය.

3. 2013.10.01 දින සිට 2014.03.01 දක්වා වූ වැඩ තහනමට ලක් ව සිටි මාස පහක කාලයට නොගෙවා ඇති වැටුප් පහත සඳහන් පරිදි රුපියල් එක් ලක්ෂ විසි දහස් නව සියයක් (රු. 120,900/-) ඔහුට ගෙවිය යුතු ය.

| | | | |
|---|---|---|---|
| මූලික වැටුප | : | | රු. 15,380/- |
| 3471 දීමනා | : | | රු. 7,800/- |
| 3469 දීමනා | : | | රු. 1,000/- |
| එකතුව | : | 24,180 x 5 | = රු. 1,20,900/= |

4. මෙම ප්‍රදානයේ ඉහත 1 ඡේදයේ ආපසු ගෙවීමට ඇති නම් එම මුදල ද, ඉහත 3 ඡේදය යටතේ ගෙවිය යුතු වන හිඟ වැටුප් මුදල ද ගණනය කොට මෙම ප්‍රදානය ගැසට් පත්‍රයේ පළ වූ දිනයේ සිට එක් මසක් ඇතුලත නැගෙනහිර කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කළ යුතුය. මෙය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බව තීරණය කරමි.

එස්. විරිතමුල්ල,
බේරුම්කරු.

2022 නොවැම්බර් මස 18 වැනි දින,
බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.

EOG 03-0282

මගේ අංකය: IR/COM/03/2018/23.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2020.03.10 දිනැති හා අංක 2166/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2020.02.24 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් මොරටුව, විල්ලෝරා වත්ත, මෙන්දිස් පාර, නො. 90/ඒ හි පදිංචි ප්‍රියන්ති රේණුකා පීරිස් මිය සහ කොළඹ 07, බෞද්ධාලෝක මාවත, නො. 215 හි පිහිටි ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2022.12.27 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 මාර්තු මස 02 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.
බේරුම්කරු ඩී.ජී.කේ. කරුණාරත්න මහතා ඉදිරිපිට දී ය.

ප්‍රියන්ති රේණුකා පීරිස්,
අංක 90/ඒ, මෙන්දිස් පාර,
විල්ලෝරා වත්ත,
මොරටුව.

*ගොනු අංකය:* IR/COM/03/2018/23.
බේරුම්කරණ අංශය: ඒ/10/2020

*පළමු පාර්ශවය*

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය,
අංක 215,
බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

*දෙවන පාර්ශවය*

**අතර පවත්නා කාර්මික ආරාවුල**

නිපුනතා සංවර්ධන රැකියා හා කම්කරු සබඳතා අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 4 සහ 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) පනත් වලින් සංශෝධනය වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම්කිරීමෙන් නිරවුල් කිරීම සඳහා නීතිඥ ඩී.ජී.කේ. කරුණාරත්න වන මා බේරුම්කරු වශයෙන් පත්කර ඇත.

මෙම ආරාවුල පිළිබඳව කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ යොමුව පහත පරිදි වේ.

"ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ කළමනාකාරිනියක ලෙස සේවය කරන ප්‍රියන්ති රේණුකා පීරිස් මහත්මියට 2012 ඔක්තෝබර් මස සිට රු. 10,000.00 ක ප්‍රවාහන දීමනාවක් නොලැබීමෙන් හා 2013 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන පරිදි ජේ.එම්. 1-1 වැටුප් තලයේ නොපිහිටු වීමෙන් අසාධාරණයක් සිදු වී තිබේ ද යන්න හා එසේ අසාධාරණයක් සිදු වී ඇත්නම් කුමන සහනයක් හිමි විය යුතු ද යන්න පිළිබඳවයි.

මෙයට අදාළ කාර්මික ආරාවුලට පාදක වී ඇත්තේ

01. ඉල්ලුම්කාරිය 1989.11.01 වන දින සිට ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ වෙළඳ සහකාරිනියක ලෙස (ලක්සල) සේවයට බැඳී ඇත.
2000.03.15 සිට සහකාර කළමණාකාරිනි තනතුරට ද 2004.02.02 සිට කළමනාකාරිනි තනතුරට ද පත් කළ බව ඇය සඳහන් කරයි. දෙවන පාර්ශ්වය මේ සම්බන්ධයෙන් හබ කර නැත. තමාගේ තනතුර කළමනාකාරිනිය වුව ද එම වැටුප් තලයේ පිහිටුවා නැති බව ද ප්‍රකාශ කර සිටී. 2012 සිට තමාට හිමි ප්‍රවාහන දීමනා නොගෙවූ බව ද කියා සිටී. අලෙවි ප්‍රවර්ධන නිලධාරිනියට හිමි දිරි දීමනාව ද තමාට නොගෙවූ බව ඉල්ලුම්කාරිය කියා සිටී.

තමා වසර 30 සේවා කාලයක් සපුරා ඇති බව කියා සිටින ඇය මෙම ආරාවුලට හේතු වී ඇත්තේ ප්‍රදර්ශනාගාර කළමණාකාරිනියට හිමි දිරිදීමනාව 2012 සිට ලබා දිය යුතු ප්‍රවාහන දීමනාව හා වැටුප් වර්ධක හා හිඟ මුදල් ද නොගෙවා සිටීම නිසා ඇයට බලවත් අසාධාරණයක් සිදු වී ඇති බවයි.

පෙනී සිටීම

පළමු වන පාර්ශ්වය වෙනුවෙන්

එක්සත් වෙළඳ සේවා සංගමයේ ප්‍රධාන ලේකම් ජයන්තා පන්නිලගේ මහතා

දෙවන පාර්ශ්වය වෙනුවෙන්

නීතිඥ රංජිත රණවක මහතා

මෙම පරීක්ෂණය 2021.02.02 දින ආරම්භ කොට 2022.09.21 වන දින අවසන් කරන ලදී. ලිඛිත දේශන ලබා දීම 2022.10.31 වන දින නියම කරන ලදී. වගඋත්තරකාර පක්ෂයේ ලිඛිත දේශන 2022.11.17 වන දින භාර දුන් අතර ඉල්ලුම්කාර පාර්ශ්වයේ ලිඛිත දේශන භාර දෙනු ලැබුවේ 2022.11.29 වන දින දීය. ඉල්ලුම්කාර පාර්ශ්වයේ නියෝජිත ජයන්ති පන්නිලගේ මහතාගේ හදිසි අභාවය නිසා නියමිත දිනට ලිඛිත දේශන ඉදිරිපත් කිරීමට නොහැකි වූ බැවින් ඒ සඳහා තවත් කාලයක් අවශ්‍ය බව කියා සිටි බැවින් ඒ සඳහා තවත් කාලයක් ලබා දෙන ලදී.

පළමු පාර්ශ්වය විසින් සිය පළමු ප්‍රකාශය 2020.05.22 දින ඉදිරිපත් කළ අතර දෙවන පාර්ශ්වය සිය පළමු ප්‍රකාශය 2020.07.07 දින ඉදිරිපත් කළ අතර සිය ප්‍රතිඋත්තරය 2020.08.17 වන දින භාර දී ඇත. දෙවන පාර්ශ්වයේ ප්‍රකාශයට ඉල්ලුම්කාරිය විසින් 2020.08.12 දින සිය පිළිතුරු ප්‍රකාශය ඉදිරිපත් කර ඇත.

පළමු ප්‍රකාශය හා දිවුරුම් ප්‍රකාශයක් මඟින් සිය සාක්ෂිය ඉදිරිපත් කර තිබීම නිසා ඒ අනුව වගඋත්තරකාර පක්ෂය විසින් හරස් ප්‍රශ්න විමසමින් නඩුව ආරම්භ කරන ලදී.

## ප්‍රදානය

පළමු පාර්ශ්වයේ ඉල්ලීම වූයේ :

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ කළමණාකාරිනිය ලෙස සේවය කරන ප්‍රියන්ති රේණුකා පීරිස් මහත්මියට 2012 ඔක්තෝබර් මස සිට රු. 10,000.00 ක ප්‍රවාහන දීමනා නොලැබුණ බව හා 2013 සිට ජේ.එම් -1-1 වැටුප් තලයේ නොපිහිටුවා ඇති බැවින් එකී ප්‍රවාහන දීමනාව ලබා දෙන ලෙසට හා ජේ.එම්. - 1-1 වැටුප් තලයේ පිහිටුවා ඊට හිමි වැටුප් ලබා දෙන ලෙසට ඉල්ලා සිටී.

දෙවන පාර්ශ්වය කියා සිටින්නේ :

ඉල්ලුම්කාරියගේ ඉල්ලීම ඉටු නොකළ හැකි බවත් කාර්මික ආරාවුල් පනතේ 4(1) හා 44 බී (1) සී අනුව කාලවරෝධයට යටත් කරුණක් බවත් කම්කරු කොමසාරිස්තුමා, ගරු අමාත්‍යතුමා මෙම බේරුම්කරණය සඳහා 4 (1) හා 44 බී (1) සී වගන්තියට පටහැනි බව පෙනෙනා කරුණක් බවත් කියා සිටී. 1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනතේ අදාළ කාර්මික ආරාවුල ඇති වූ දින සිට කවර කාලයක් තුළ එය සිදු කළ යුතු බවට කාල සීමාවක් දක්වා නැති නිසාත් ඉල්ලුම්කාරිය වරින් වර කම්කරු කොමසාරිස්තුමාට පැමිණිලිකර තිබීම නිසාත් කම්කරු කොමසාරිස්තුමා විසින් මෙම ආරාවුල විසඳීම සඳහා පළමු පියවර ගෙන තිබීම නිසාත් වගඋත්තරකාර පාර්ශ්වයේ විරෝධතාවය ප්‍රතික්ෂේප කරමි. තව ද මෙම ආරාවුල බේරුම්කරු වෙත යොමු කරන අවස්ථාව සිද්ධිය ඇති වූ දින සිට කවර කාල සීමාවක් තුළ දී ද යන්න ගැන අදාළ පනතේ සඳහන් නොවන බව ද අවධාරණය කරමි.

ඉල්ලුම්කාරිය හරස් ප්‍රශ්න වලට පිළිතුරු ලබා දෙමින් මෙසේ ප්‍රකාශ කර සිටී.

1989 ආධුනික පුහුණු වන්නියක් වශයෙන් ලක්සලට සම්බන්ධ වී 1990-1991 දී ස්ථිර තනතුරට පත්වී 2000 දී 4 ඒ සහකාර කළමනාකාරවරියක් වශයෙන් පත් වූ බවත් තමා පත්කර තිබෙන්නේ එම් ඒ 1-2 හැටියට බවත් අනෙක් කළමනාකරුවන් ජේ.එම්. තනතුරට පත් කර තිබෙන බවත් එසේ කර තිබෙන්නේ 2012 බවත් කියා සිටී. (සා.ස 11 පිටුව)

කටුබැද්ද ෂෝ රූම් මැනේජර් යටතේ තමා පත් කළ බවත් එම මැනේජර් තමාට වඩා ජූනියර් බවත් තවදුරටත් කියා සිටී (15 පිටුව) 2004 දී කළමනාකාරිනිය ලෙස පත්වීමක් ලැබූ බව දන්වා සිටී. (සා.ස 19 පිටුව)

තමාට හිමි තනතුරට නියමිත වැටුප ලබා දෙන ලෙසට අධ්‍යක්ෂ අලෙවි මගින් අධ්‍යක්ෂ (පාලන) වෙත 2015 සිට ඉල්ලීම් ඉදිරිපත් කළ බව ද ඉල්ලුම්කාරිය නැවත විමසීම් වලට පිළිතුරු දෙමින් කියා සිටී. (5 පිටුව)

එයට පිළිතුරු නොලැබූ බව ද කියා සිටින අතර එම ඉල්ලීමට පිළිතුරු නොලැබුණු නිසා කම්කරු කොමසාරිස්තුමාට පැමිණිලි කළ බව කියා සිටී. (ඒ - 15 ඒ - 21, ඒ - 22 ඒ - 23) ඉන් අනතුරුව කාර්මික සම්බන්ධතා අංශයට පැමිණිලි කළ බව ද ඒ - 24 ඉදිරිපත් කරමින් කියා සිටී. ඉන් ප්‍රශ්නය නොවිසඳුන නිසා කාර්මික අධිකරණයට යොමු කළ බව කියා සිටී, (සා.ස 9 පිටුව)

කළමනාකාරිනිය උසස් වීම් තනතුරට පත් වූ බව ඒ - 5 ලේඛනයෙන් සඳහන් කර ඇති බව කියා සිටින ඇය තමාට හිමි ජේ එම් වැටුප් තලය ලබා දී නැති බව ප්‍රකාශ කරයි.

ඒ - 8 ලේඛනය අනුව ෂෝ රූම් මැනේජර් නිල්මිණී දමයන්ති යන අයට එම් ඒ 1-2 වැටුප් තලයේ සිට ජේ එම් 1-1 වැටුප් තලයට හිමි වැටුප ලබා දී ඇති බව පෙනී යයි. ඒ - 8 ලේඛනය කෙරෙහි වගඋත්තරකරු විරෝධතාවය ප්‍රකාශ කර ඇත. ඉල්ලුම්කාරිය ප්‍රදර්ශනාගාර කළමනාකාරිනියක නිසා ඇයට ද ජේ එම් 1 -1 වැටුප ලබා දෙන ලෙස ඉල්ලා සිටී. කළමනාකරුවන්ට ජේ එම් 1-1 වැටුප ලබා දෙන්නේ නම් කළමනාකාරිනියක් වූ ඉල්ලුම්කාරියට එය ලබා නොදීම සමානයන් අතර අසමාන ලෙස සැලකීමක් නිසා ඇයට අසාධාරණයක් වී ඇත. එබැවින් ඇයගේ ඉල්ලීම පරිදි ඇය 2013 සිට ජේ එම් 1-1 වැටුප් තලයේ පිහිටුවා ඒඅයට හිමි වැටුප ලබා දෙන ලෙස නියෝග කරමි. එම නිසා එම් ඒ 1-2 වැටුප් තලය අනුව 2013 සිට ඉල්ලුම්කාරියට ගෙවන ලද වැටුප අඩු කොට ජේ එම් 1-1 වැටුප් තලයේ පිහිටුවා එය ලබා දෙන ලෙසට නියෝග කරමි. ඇය ලබා ගෙන තිබූ වැටුප මෙසේ දක්වේ.
එම් ඒ 1-2 2013 ජනවාරි සිට දෙසැම්බර් දක්වා (මූලික වැටුප)

| | |
|---|---|
| 2013 | 233970 |
| 2014 | 234840 |
| 2015 | 240015 |
| 2016 | 267275 |
| 2017 | 356705 |
| 2018 | 418116 |
| 2019 | 479023 |
| 2020 | 542810 |
| 2021 | 552750 |
| 2022 | 561980 |
| | 3887484 |

2016 දී වැටුප් තලයන් හි සංශෝධනය කර ඇත.

2013 සිට 2015 දක්වා ජේ එම් 1-1 ට ඇයට හිමි විය යුතු වැටුප (මූලික)

| | |
|---|---|
| 2013 | රු. 245880 |
| 2014 | රු. 249780 |
| 2015 | රු. 253680 |
| | රු. 749340 |

ජේ එම් 1-1 වැටුප් තලයේ 2016 සිට 2022 දක්වා ඇයට හිමි වැටුප

2016 සිට 2022 දක්වා ජේ එම් 1-1 වැටුප් තලයේ ලැබිය යුතු මූලික වැටුප (ජනවාරි සිට දෙසැම්බර් දක්වා)

| | |
|---|---|
| 2016 | රු. 511200.00 |
| 2017 | රු. 520260.00 |
| 2018 | රු. 529320.00 |
| 2019 | රු. 538380.00 |
| 2020 | රු. 547440.00 |
| 2021 | රු. 556260.00 |
| 2022 | රු. 565320.00 |
| | රු. 3768180.00 |

01. 2016 වැටුප් සංශෝධනය අනුව ජේ එම් 1-1
    වැටුප තලයට හිමි 2013 සිට 2015 දක්වා වැටුප -රු. 749340.00
02. 2016 වැටුප් සංශෝධනයට අනුව ජේ එම් 1-1 වැටුප්තලයට
    හිමි 2016 සිට 2022 දක්වා හිමි විය යුතු මූලික වැටුප - රු. 3768180.00

ජේ එම් 1-1 අනුව හිමි විය යුතු වැටුප - රු. 4517520.00

MA 1-2 වැටුප් තලය යටතේ ඉල්ලුම්කාරිය විසින් 2013 ජනවාරි මස සිට 2022 දෙසැම්බර් මස දක්වා මූලික වැටුපක් වශයෙන් ලබාගෙන තිබූ මුදල - රු. 3887484.00

J m 1-1 වැටුප් තලය යටතේ ඇයට ලැබිය යුතු මූලික වැටුප
2006 වැටුප් සංශෝධනයට අනුව (2013-2015) - රු. 749340.00

JM 1-1 වැටුප් තලය 2016 වැටුප් සංශෝධනයට අනුව (2016-2022) - රු. 3768180.00
ඇයට හිමිවිය යුතු වැටුප - රු. 4517520.00

J M 1-1 හා M A 1-2 හි වෙනස) 4517520 - 3887484 - රු. 3887484.00

ඉල්ලුම්කාරිනියට ගෙවිය යුතු වැටුප - රු. 630036.00

ප්‍රවාහන දීමනා සම්බන්ධයෙන් ඉල්ලුම්කාරිනිය හරස් ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් ප්‍රකාශ කර සිටින්නේ ''මම දන්නා විදියට බෝඩ් එකේ අනුමත වෙලා තිබුණේ කළමනාකාර තනතුරට රු. 10,000.00 ඇසිස්ටන් මැනේජර්ලට රු. 7500.00 ක් අනිත් අයට රු. 5000.00ක් වශයෙන් (සා.ස පිටු 25 පිටුව) දෙවන පාර්ශවය විසින් මෙය අභියෝගයට ලක් කර නැත.

මහනුවර ශාඛාවේ බන්දුල සෙනවිරත්න මහතා කළමනාකරුවෙකි. ඔහුට 2011 ජූලි මස සිට මසකට රු. 10,000.00 බැගින් ප්‍රවාහන දීමනාවක් ලබා ඇති බව අධ්‍යක්ෂ මානව සම්පත් චන්දන කුමාර දහනායක මහතා හරස් ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් පිළිගෙන ඇත. (කාර්ය සටහන් 7 වන පිටුව) එම කළමනාකරුට රු. 10,000.00 ක් ප්‍රවාහන දීමනාවක් ලබා දුන්නා නම් කළමනාකාර තමාට ද එම දීමනාව ලබා දෙන ලෙස ඉල්ලුම්කාරිය අවධාරණය කර සිටී.

කම්කරු කොමසාරිස්තුමා වෙත ඉල්ලීම කිහිපයක් ඉදිරිපත් කරමින් ඇය ඉල්ලා සිටින්නේ 2012 සිට තමාට ද මෙම රු. 10,000.00 ක ප්‍රවාහන දීමනාවක් ලබා දෙන ලෙසට ය. එමෙන්ම බේරුම්කරණ අධිකරණයේ දී ඇය එම ප්‍රවාහන දීමනාව ලබා දෙන ලෙස ඉල්ලා සිටී. 2012 දී නොගෙවන ලද රු. 10,000.00 ක ප්‍රවාහන දීමනාව නැවත 2017 සිට ගෙවීමට වගඋත්තරකාර පාර්ශ්වය තීරණය කිරීමෙන් පෙනී යන්නේ ඇයට එය නොගෙවීම ඇයට කරන ලද අසාධාරණයක් ලෙස පිළිගත් බැවිනි.

එක් කළමනාකරුවෙකුට රු. 10,000.00 ක ප්‍රවාහන දීමනාවක් ගෙවීමත් තවත් කළමනාකරුවෙකුට එය නොගෙවීමත් සමානයන් අතර අසමාන අයුරින් සැලකීමක් ලෙස පෙනී යයි.

ඉල්ලුම්කාරියට 2017.04.01 දින සිට ප්‍රවාහන දීමනාව රු. 10,000.00 අනුමත කර ඇති බව ආර් - 1 ලේඛනයෙන් පිළිගෙන ඇත. ඉල්ලුම්කාරිය ඒ - 14 ලේඛනයෙන් එය තහවුරු කර ඇත.

2016 මැයි සිට රු. 5000.00 ප්‍රවාහන දීමනාවක් තමාට ලබා දුන් බව පැමිණිලිකාරිය ඒ - 24 ලිපියෙන් දක්වා ඇත. 2016 සිට රු. 5000.00 ප්‍රවාහන දීමනාවක් ඉල්ලුම්කාරිය ලබා දුන් බව අධ්‍යක්ෂ මානව සම්පත් දහනායක මහතා පිළිගෙන ඇත. (සා.ස 13 පිටුව) රු. 5000.00 ප්‍රවාහන දීමනාව නොලැබුණ සේවකයන් නොසිටි බව ද ඔහු තවදුරටත් කියා සිටී. සියලුම සේවකයන්ට මෙම ප්‍රවාහන දීමනාව ලබා දී තිබුණ බව සනාථ වෙයි.

2012 සිට ලැබිය යුතු රු. 10,000.00 ක ප්‍රවාහන දීමනාව 2017 මාර්තු මාසය දක්වා ඉල්ලුම්කාරියට පහත පරිදි ගෙවිය යුතු බවට නිගමනය කරමි.

| | |
|---|---|
| 2012 ජනවාරි සිට දෙසැම්බර් දක්වා | 10000x12 = 120000 |
| 2013 ජනවාරි සිට දෙසැම්බර් දක්වා | 10000x12 = 120000 |
| 2014 ජනවාරි සිට දෙසැම්බර් දක්වා | 10000x12 = 120000 |
| 2015 ජනවාරි සිට දෙසැම්බර් දක්වා | 10000x12 = 120000 |
| 2016 ජනවාරි සිට මාර්තු දක්වා | 10000x3 = 30000 |
| | 510000 |

ඒ අනුව ඇයට රු. 510,000.00 ක මුදලක් ප්‍රවාහන දීමනාව වශයෙන් 2012 සිට 2017 මාර්තු මස දක්වා ගෙවීමට නියෝග කරමි.

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ 1989.11.01 දින සිට දීර්ඝ කාලයක් සේවයේ යෙදී සිටින ඉල්ලුම්කාරියට ප්‍රවාහන දීමනාව වන රු. 510,000.00 ක හා ජේ.එම්. 1-1 වැටුප් තලයට හිමි ඉහත සඳහන් කළ රු. 630036.00 ක මුදලක් ලබා ගැනීමට හැකිවන පරිදි මෙම නියෝගය ගැසට් පත්‍රයේ පළ කළ දින සිට දින 14ක් ඇතුලත මැද කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කරන ලෙසට මෙයින් නියෝග කරමි. තවද මෙම ප්‍රදානය ගැසට් පත්‍රයේ පල කළ දින සිට මසක් ඇතුලත ක්‍රියාත්මක කර ඒ බව මැද කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් වෙත දැනුම් දිය යුතු බව මෙමගින් නියම කරමි. මෙය ගණනය කරන ලද්දේ මූලික වැටුප පදනම් කර ගෙන බැවින් ඉල්ලුම්කාරියට හිමි සේවක අර්ථ සාධක හා සේවක භාරකාර අරමුදල් හා අනෙකුත් සී.ඕ.එල් හා විශේෂ දීමනා සම්බන්ධයෙන් කම්කරු කොමසාරිස් ජනරාල් වෙත ඉල්ලීම් කිරීමට මෙම ප්‍රදානය බාධාවක් නොවන බව ද දන්වමි.

නීතිඥ ඩී.ජේ.කේ. කරුණාරත්න,
බේරුම්කරු.

2022 දෙසැම්බර් මස 27 වැනි දින,

EOG 03-0283